මගේ අංකය: කාසේසේ/V/රා.පරි.අමා./25/2014
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2014.11.19

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>තාවකාලික /අනියම්(දෛනික)/ ආදේශක/ කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගන්නා ලද සේවකයින්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 යටතේ ස්ථිර පත්වීම් ලබා දීම සඳහා තොරතුරු ලබා ගැනීම</u>**

වර්ෂ 2014 නොවැම්බර් මස 12 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි. ඒ අනුව ඔබ අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ තාවකාලික /අනියම්(දෛනික)/ ආදේශක/ කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගත් ඒකාබද්ධ සේවයට බඳවාගත හැකි තනතුරු සහිත නිලධාරින් ස්ථිර කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

I. රා.පරි.ච 25/2014 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.
II. දින 180 ක අඛණ්ඩ සේවා කාලයක් සපුරා තිබිය යුතුය.
III. ඒකාබද්ධ සේවයට අයත් තනතුරුවල සේවය කර තිබිය යුතුය.
IV. රියදුරු තනතුරු සඳහා තාවකාලික /අනියම්(දෛනික)/ ආදේශක/ කොන්ත්‍රාත් හෝ සහන පදනමට පත්වූ දිනට, පෞද්ගලික / කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (අවම වශයෙන් සී සහ සී 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය.)

02. ඉහත සුදුසුකම් සෑම ආකාරයෙන්ම සපුරන ලද සේවකයන් සඳහා පමණක් තාවකාලික පත්වීම් ලිපි ආයතන ප්‍රධානියා විසින් නිකුත් කළ යුතුය. තාවකාලික පත්වීම් ලිපියේ ආකෘතිය මේ සමග අමුණා ඇත(කා.සේ.සේ ඇමුණුම 01,රියදුරු ඇමුණුම 02). එක් එක් නිලධාරියා වෙනුවෙන් වෙන වෙනම ගොනු සකස් කර විධිමත් පත්වීම් නිකුත් කිරීම සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රයද (කා.සේ.සේ ඇමුණුම 03, රියදුරු ඇමුණුම 04) සම්පූර්ණ කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුය. ගොනු සැකසීමේදී කා.සේ.සේ ඇමුණුම 05, රියදුරු ඇමුණුම 06 හි සඳහන් ලිපි ලේඛන වල සහතික පිටපත්ද අමුණා එවිය යුතුය.

03. ඉහත සඳහන් ආකාරයට සුදුසුකම් සපුරා නොමැති සේවකයන් වෙත විධිමත් පත්වීම් ලබාදීමට හැකියාවක් නොමැති බැවින්, තාවකාලික පත්වීම් ලබා දීමේදි අදාළ සුදුසුකම් සපුරා ඇති බවට ඔබ පෞද්ගලිකවම සෑහීමකට පත් විය යුතුවේ.

04. තාවකාලික පත්වීම් ලිපි නිකුත් කර මාස 03 ක් ඉක්ම යාමට පෙර විධිමත් පත්වීම් ලිපි නිකුත් කිරීම සඳහා, එම ගොනු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලෙසද වැඩිදුරටත් දන්වමි.

කේ. වී. පී .එම් .ජේ. ගමගේ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම 01

**තාවකාලික පත්වීම් ලිපිය**

මගේ අංකය:-

............................ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව

කොළඹ.

2014.                දින.

............................................................ මගින්,

............................................................. මහතා/මහත්මිය/මෙනවිය වෙත.

ජා.හැ.අංකය :- ..........................................................................

<u>**කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම**</u>

රා.පරි.චක්‍රලේඛ 25/2014 ප්‍රකාරව ........................ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔබ කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ ............................... තනතුරකට පත් කරමි.

02. මෙය තාවකාලික පත්වීම් ලිපියක් වන අතර, නියමිත සුදුසුකම් සපුරා තිබේ නම් විධිමත් පත්වීම් ලිපියක් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් යථා කාලයේදී නිකුත් කරනු ඇත. එසේ නොවන්නේ නම් මෙම පත්වීම අවලංගු කිරීමට කටයුතු කරනු ඇත.

03. ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තු නියෝග වලට හා කලින් කළ ආණ්ඩුව විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි සහ නියෝග වලටද, ඔබ යටතේ විය යුතුය.

04. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 11730 - 10 X 120 - 10 X130 - 10 X 145 - 12 X 160 - 17600/= කි. 2006.04.25 දිනැති අංක 06/2006 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධි විධාන අනුව වැටුප් ගෙවනු ලැබේ. පත්වීමේ දින සිට වසර තුනක් ඇතුලදී කාර්යාල සේවක සේවයේ III පන්තියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් ඔබ සමත් විය යුතුය.

05. මෙම ලිපිය ලැබුණු බවත්, මෙහි දැක්වෙන කොන්දේසි යටතේ ඔබ මෙම තනතුර භාර ගන්නේද යන්න දෙසතියක් තුළ දී මා වෙත දන්වන්න. සාධාරණ හේතුවක් නොමැතිව ඉහත සඳහන් පරිදි රාජකාරියට වාර්තා කිරීමට ඔබ අපොහොසත් වුවහොත් මෙම පත්වීම අවලංගු වනු ඇත.

.........................................................

අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ

අත්සන

මුද්‍රාව :-

පිටපත :- ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම 02

<u>**තවකාලික පත්වීම් ලිපිය**</u>

මගේ අංකය :-

............................අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව

2014 දින

........................................... මගින්,

.......................................... මහතා

ජා.හැ.අ. :- ....................................

<u>**රියැදුරු සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම.**</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 ප්‍රකාරව .......................... දින සිට ක්‍රියාත්මක වන පරිදි රියැදුරු III ශ්‍රේණියේ තනතුරකට පත් කරමි.

02. මෙය තාවකාලික පත්වීම් ලිපියක් වන අතර නියමිත සුදුසුකම් සපුරා තිබේ නම් විධිමත් පත්වීම් ලිපියක් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් යථා කාලයේදී නිකුත් කරනු ඇත. එසේ නොවන්නේ නම් මෙම පත්වීම අවලංගු කිරීමට කටයුතු කරනු ඇත.

03. ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තු නියෝගවලට හා කලින් කල ආණ්ඩුව විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි සහ නියෝග වලටද ඔබ යටත් විය යුතුය.

04. මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 12,470 -10x130 - 10x145 - 10x160 - 12x170 - 18,860 ක් වේ. රු. 12, 860 ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉමකි. (2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ අංක 06/2006 අනුව)

05. මෙම ලිපිය ලැබුණු බවත්, මෙහි දැක්වෙන කොන්දේසි යටතේ ඔබ මෙම තනතුර භාරගන්නේද යන්න මාවෙත දන්වන්න.

..................................................

අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ

අත්සන

මුද්‍රාව:-

පිටපත - ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම 03

**<u>රාජ්‍ය ආයතනවල තාවකාලික, අනියම්,ආදේශක,සහන සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද කාර්යාල සේවක සේවකයින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 යටතේ ස්ථිර පත්වීම් ලබා දීම සඳහා තොරතුරු ලබා ගැනීම</u>**

01. නම : -...........................................................................................................................

02. ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපතක් ☐

03. සේවක මහතාගේ තාවකාලික/අනියම්/(දෛනික)/ආදේශක /කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගත් ලිපියේ සහතික කරන ලද පිටපත ☐
පත්වීමේ දිනය ............................ හා තනතුර ...............................................

04. පත්වීම ලබා දී ඇත්තේ කවරෙකු විසින් ද යන වග ☐

05. චර්යා සටහනේ (පොදු 226 'අ') සහතික කරන ලද පිටපත 2014.10.24 දිනට වැඩ කරන දින 180 සම්පූර්ණ කර තිබේද ? ඔව් ☐ නැත ☐

06. උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත
උපන් දිනය.......................................... ජාතික හැඳුනුම්පත් අංකය............................
තනතුරට බඳවා ගන්නා අවස්ථාවේ ............................ දිනට වයස ................................

07. අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත්
ශිෂ්‍ය කාර්ය දර්ශනය අනුව -: 8 ශ්‍රේණිය/9 වසර සමත් ද ? ඔව් ☐ නැත ☐
සමත් වූ පාසල -: ........................................................................................................... ☐

08. බඳවා ගැනීම කළමනාකරණ සේවා චක්‍රලේඛ 33 අනුව ද ?

09. ඉදිරිපත් කරන සහතික වල නමෙහි වෙනසක් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්(අමුණා ඇත) ඔව් ☐ නැත ☐

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 අනුව සුදුසුකම් සපුරා ඇති/නොමැති හෙයින් 2014.10.24 දිනට ඒකාබද්ධ කාර්යාල සේවක සේවයේ (.......................................) තනතුරකට පත්කිරීම නිර්දේශ කරමි./නොකරමි.

......................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

....................................

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

ඇමුණුම **04**

**<u>රාජ්‍ය ආයතනවල තාවකාලික, අනියම්,ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගන්නා ලද රියදුරන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 යටතේ ස්ථිර පත්වීම් ලබා දීම සඳහා තොරතුරු ලබා ගැනීම</u>**

01. නම : -..........................................................................................................................................

02. ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත ☐

03. සේවක මහතාගේ තාවකාලික/අනියම්/(දෛනික)/ආදේශක /කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගත් ලිපියේ සහතික කරන ලද පිටපත ☐

පත්වීමේ දිනය ............................ හා තනතුර ............................................... ☐

04. පත්වීම ලබා දී ඇත්තේ කවරෙකු විසින් ද යන වග

05. චර්යා සටහනේ (පොදු 226 'අ') සහතික කරන ලද පිටපත 2014.10.24දිනට වැඩ කරන දින 180 සම්පූර්ණ කර තිබේද ? ඔව් ☐ නැත ☐

06. උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත

උපන් දිනය......................................... ජාතික හැඳුනුම්පත් අංකය ......................................

තනතුරට බඳවා ගන්නා අවස්ථාවේ........................... දිනට වයස ...........................................

07. අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත්

ශිෂ්‍ය කාර්ය දර්ශනය අනුව -: 8 ශ්‍රේණිය/9 වසර සමත් ද ? ඔව් ☐ නැත ☐

සමත් වූ පාසල -: ...........................................................................................................

08. බඳවා ගැනීම කළමනාකරණ සේවා චක්‍රලේඛ 33 අනුව ද ? ☐

09. කල් ඉකුත් වී නොමැති රියදුරු බලපත්‍රයේ සහතික කරන ලද පිටපතක ☐

10.ඉදිරිපත් කරන සහතික වල නමෙහි වෙනසක් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් (අමුණා ඇත) ඔව් ☐ නැත ☐

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 අනුව සුදුසුකම් සපුරා ඇති/නොමැති හෙයින් 2014.10.24 දිනට ඒකාබද්ධ රියදුරු සේවයේ (.......................................) තනතුරකට පත්කිරීම නිර්දේශ කරමි./නොකරමි.

......................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

....................................

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

<u>රාජ්‍ය ආයතනවල තාවකාලික, අනියම්,ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගන්නා ලද **කාර්යාල සේවක සේවකයින්** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 යටතේ ස්ථිර පත්වීම් ලබා දීම සඳහා තොරතුරු ලබා ගැනීම</u>

1. උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත
2. ජාතික හැඳුනුම්පතෙහි සහතික පිටපතක්
3. සේවක මහතාගේ තාවකාලික/අනියම්/(දෛනික)/ආදේශක /කොන්ත්‍රාත් සහන පදනම මත බඳවා ගත් ලිපියේ සහතික කරන ලද පිටපත
4. චර්යා සටහනේ (පොදු 226 ‘අ’) සහතික කරනපිටපත(2014.10.24 දිනට වැඩ කරන දින 180 සම්පූර්ණ කර තිබිය යුතුය )
5. ශිෂ්‍ය කාර්ය දර්ශනයේ සහතික කරන ලද පිටපතක්
6. ඉදිරිපත් කරන සහතික වල නමෙහි වෙනසක් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්
7. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය
8. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

<u>රාජ්‍ය ආයතනවල තාවකාලික, අනියම්,ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන  පදනම මත බඳවා ගන්නා ලද **රියදුරන්** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 යටතේ ස්ථිර පත්වීම් ලබා දීම සඳහා තොරතුරු ලබා ගැනීම</u>

3. උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත

4. ජාතික හැඳුනුම්පතෙහි සහතික පිටපතක්

3. සේවක මහතාගේ තාවකාලික/අනියම්/(දෛනික)/ආදේශක /කොන්ත්‍රාත් සහන පදනම මත බඳවා ගත් ලිපියේ සහතික කරන ලද පිටපත

4. චර්යා සටහනේ (පොදු 226 ‘අ’) සහතික කරනපිටපත(2014.10.24 දිනට වැඩ කරන දින 180 සම්පූර්ණ කර තිබිය යුතුය )

5. ශිෂ්‍ය කාර්ය දර්ශනයේ සහතික කරන ලද පිටපතක්

6. ඉදිරිපත් කරන සහතික වල නමෙහි වෙනසක් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක්

7. වලංගු රියදුරු බලපත්‍රයේ පැහැදිලි පිටපතක්

8. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

9. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය